# ශ්‍රී ලාංකේය ලෝහමය ගෘහෝපකරණ නිර්මාණ විෂයයෙහි සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථාගත සිද්ධාන්තයන් ගේ බලපෑම

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ සංස්කෘත අධ්‍යයනාංශයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධය

දිනය 2012 - ජූලි - 22


නම : දේවගොඩ පියරතන හිමි

ශිෂ්‍ය අංකය : FGS/04/02/07/2010/02



FACULTY OF GRADUATE STUDIES
RECEIVED
29 AUG 2013
UNIVERSITY OF KELANIYA

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 834 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

# සංක්ෂේපය

**ශ්‍රී ලාංකේය ලෝහමය ගෘහෝපකරණ නිර්මාණ විෂයයෙහි සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථාගත සිද්ධාන්තයන් ගේ බලපෑම**

ශ්‍රී ලාංකේය ලෝහ කර්මාන්තයේ ඉතිහාසය ක්‍රි:පූ: 09 වන සියවස දක්වා පැතිර පවතී. ශ්‍රී ලාංකේය ලෝහ කර්මාන්තය ශ්‍රී ලංකාවේ විසූ යක්ෂ ගෝත්‍රිකයන් ගෙන් පැවැතෙන බව ජනප්‍රවාදයෙහි සඳහන් වේ. විජය කුමරු පළමු වරට හමුවන විටත් කුවේණිය වලයාකාර යදම් මාලයකින් සැරසී සිටි බව මහාවංසයෙහි සඳහන් වෙයි. පණ්ඩුකාභය රාජ්‍ය සමයට පෙර සිට රන් තැටි ආහාර අනුභවය සඳහා භාවිත වූ බව මහාවංසයෙන් අනාවරණය වේ. ශ්‍රී ලාංකේය ලෝහමය ගෘහෝපකරණ නිර්මාණයෙහි ලා අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර ඥානය ශ්‍රී ලාංකේය ලෝහ නිර්මාණ ශිල්පීන්ට ලබා දෙන ලද්දේ සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථ තුළිනි. එහි දී ශිල්පීය සිද්ධාන්ත, තාක්ෂණික සිද්ධාන්ත, කලාත්මක සිද්ධාන්ත හා සමාජමය සිද්ධාන්ත වශයෙන් යථෝක්ත ශිල්ප ශාස්ත්‍ර ඥානය සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයක් වන වෛජයන්තතන්ත්‍රය මගින් ලෝහ නිර්මාණ ශිල්පීන් වෙත ලබා දී ඇත.

කලස් හා බොකුටු පඩික්කම් නිර්මාණයෙහි ලා වෛජයන්තතන්ත්‍රාගත සිද්ධාන්ත ඍජු ලෙස ම බලපා ඇති අතර ඉලත්තට්ටු, දිගැටි පඩික්කම්, කළ, හුනු කිල්ලෝට ආදිය නිර්මාණයෙහි ලා වෛජයන්තතන්ත්‍රාගත සිද්ධාන්ත බලපා ඇත්තේ අවම වශයෙනි. එහෙත් නිසි ක්‍රමවේදයකට අනුව පුරාතන ලෝහ භාණ්ඩ නිර්මාණය කර ඇති බව පැහැදිලි ය. එයින් පැහැදිලි වන්නේ වෛජයන්තතන්ත්‍රය හැරුණු විට වෙනත් සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයන් ගේ ආභාසය එම ලෝහමය ගෘහෝපකරණ නිර්මාණ කෙරෙහි ඍජු බලපෑමක් කර ඇති බව යි. ලෝහ නිර්මාණ ශිල්පය සඳහා ශිල්ප ශාස්ත්‍ර ඥානය සැපයූ ගුරුකුල හතරක් පැවැති බව ද වෛජයන්තතන්ත්‍රය එයින් එක් ගුරුකුලයක හස්තසාර ග්‍රන්ථයක් වූ බව ද පැහැදිලි ය. මල් බඳුන්, බන්දේසි, සේරක්කල, ආභරණ මඤ්ජුසා ආදිය නිර්මාණය කිරීම පිළිබඳ වෛජයන්තතන්ත්‍රයෙහි සඳහන් නොවේ. එහෙත් පඩික්කම්, තැලි, ඉලත්තට්ටු, බුලත් කරඬු නිර්මාණය පිළිබඳ වෛජයන්තතන්ත්‍රයෙහි දැක්වෙන සිද්ධාන්ත වෙනස් අයුරින් යොදා ගනිමින් ලෝහ නිර්මාණ ශිල්පීහු මල් බඳුන්, බන්දේසි, සේරක්කල, ආභරණ මඤ්ජුසා ආදිය නිර්මාණය කළහ.

රාජාභිෂේක මංගල්‍යය සඳහා ඔටුනු නිර්මාණය කර තමා ද අත ගසා රජුට ඔටුනු පැළැඳ වූ ලෝහ නිර්මාණ ශිල්පීහු පුරාතන සමාජයෙහි ඉහළ සමාජ තත්ත්වයක වැජඹුණහ. ශ්‍රී ලංකාව ඉංග්‍රීසි පාලනයට නතු වීමත් සමඟ ලෝහ නිර්මාණ ශිල්පීන්ගේ සමාජ තත්ත්වය පරිහානියට පත් විය.

නූතන ශ්‍රී ලාංකේය ලෝහමය ගෘහෝපකරණ නිර්මාණය බෙහෙවින් ම දුර්වල මට්ටමක පවතී. නිසි ප්‍රමිතියෙන් යුතු කලාත්මක නිර්මාණ වශයෙන් ලෝහමය ගෘහෝපකරණ නිර්මාණය කිරීමට අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර ඥානය නූතන ලෝහ නිර්මාණ ශිල්පීන්ට නොමැති වීම මෙයට හේතුවයි. වෛජයන්තතන්ත්‍රාගත ශිල්පීය, සිද්ධාන්ත, තාක්‍ෂණික සිද්ධාන්ත, කලාත්මක සිද්ධාන්ත හා සමාජමය සිද්ධාන්තයන්ට අනුගත ව ලෝහමය ගෘහෝපකරණ නිර්මාණය කරන්නේ නම් උසස් ප්‍රමිතියෙන් යුතු කලාත්මක භාවයෙන් පරිපූර්ණ ලෝහමය ගෘහෝපකරණ නිර්මාණය කිරීමට ඉඩ ප්‍රස්තා හිමි වේ. එවිට විදේශීය සංචාරකයෝ ද ඒවා මිලදී ගැනීමට පෙළඹෙති. ශ්‍රී ලංකාවට විදේශ විනිමය මෙන් ම ජාත්‍යන්තර කීර්තිය හිමි වීමට ද එය හේතුවක් වනු ඇත.

---

මුඛ්‍ය පදඃ ශිල්ප ශාස්ත්‍ර, සිද්ධාන්ත, ඉලත්තට්ටු, පඩික්කම්, හුනුකිල්ලෝට, කලස්